සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**Royal College - Colombo 07**
**රාජකීය විද්‍යාලය - කොළඹ 07**

11 | S | I

*Grade 10 – First Term Test – July 2023*

කාලය : පැය 1
Time: 1 hour

පළමු වාර පරීක්ෂණය - 2023 ජූලි - 10 ශ්‍රේණිය

# බුද්ධ ධර්මය - I

Name: - ............................................ Class: -.................. Index no: - ........................

**සැලකිය යුතුයි**

- **අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

01. සතර සෘද්ධිපාද වලින් එකකි,
(1) ලෝභ (2) මෝහ (3) චිත්ත (4) ශීල

02. පංචස්කන්ධයට අයත් වේ,
(1) සංඛාර (2) ඇස (3) වීරිය (4) චිත්ත

03. බුදුන් වහන්සේට අවසාන දානය පිළිගැන්වූයේ,
(1) සුජාතා සිටු දේවිය (2) සාරි බැමිණිය
(3) චුන්දකර්මාර පුත්‍රයා (4) අනාථ පිණ්ඩික සිටුතුමා

04. බෞද්ධයන් විසින් දැක සංවේගය ඇති කර ගත යුතු ස්ථානයකි,
(1) ඉසිපතනාරාමය (2) විශාලා මහනුවර
(3) බේලුවගම (4) මගධය

05. කූඨාගාර ශාලාව පිහිටා තිබුණේ කවර ප්‍රදේශයකද ?
(1) විශාලා මහනුවර (2) සැවැත්නුවර
(3) රජගහනුවර (4) නාලකගම

06. ප්‍රථම රහත් සැටනමට අයත් වේ,
(1) යසකුල පුත්‍රයා (2) ධර්මාරාම හිමි
(3) සුභද්‍ර තෙරුන් (4) ආනන්ද හිමි

07. බුදුන් වහන්සේගේ ආකර්ෂණීය වාග් විලාසය වර්ණනා කළේ කවුරුන්ද ?
(1) කොසොල් රජතුමා (2) බිම්බිසාර රජතුමා
(3) අජාසත්ත රජතුමා (4) අශෝක රජතුමා

08. සඟ ගුණ නමයෙන් එකකි,
(1) උජුපටිපන්න (2) අරහං
(3) භගවා (4) අකාලිකෝ

09. ශ්‍රී පාද වන්දනාව සිදු කරන කාල පරාසය වන්නේ,
(1) ජනවාරි සිට ජුනි මස දක්වාය. (2) පෙබරවාරි මස සිට අප්‍රේල් මස දක්වාය.
(3) ජනවාරි මස සිට මැයි මස දක්වාය. (4) මාර්තු මස සිට අගෝස්තු මස දක්වාය.



Scanned with CamScanner

10. සිදුහත් කුමරු ආනාපානසති භාවනාව සිදු කළේ කවර ස්ථානයක සිටද ?
(1) අනුපිය නම් අඹ වනයේ සිටය.
(2) ලුම්බිණි සල් උයනේ සිටය.
(3) වප් මඟුල් උළෙලදා දඹ රුක් සෙවනේ සිටය.
(4) උපවත්තන සල් උයනේ සිටය.

11. පස් මහ බැලුම් ගණනයට අයත් වේ,
(1) දේශය (2) ජාතිය (3) ශීලය (4) කැපවීම

12. සිදුහත් බෝසතුන්ට මනුලොව ඉපදීමට ආරාධනා කළේ,
(1) සහම්පති බ්‍රාහ්මණයාය. (2) අසිත තවුසාය.
(3) කාලදේවලය. (4) සහම්පති දෙවියාය.

13. සිදුහත් කුමරුගේ ගුරුවරයා මේ නමින් හඳුන්වයි,
(1) සුප්පබුද්ධ රජ (2) කාලදේවල
(3) සච්චක (4) සර්වමිත්‍ර බමුණා

14. සිදුහත් කුමරුගේ විවාහ ජීවිතය හා අභිනිෂ්ක්‍රමණය සිදු වූ වයස් පිළිවෙලින් වන්නේ,
(1) 16 - 29 (2) 29 - 32 (3) 17 - 29 (4) 29 - 17

15. නිබ්බුත පද කීවේ,
(1) විශාඛාවන්ය. (2) යසෝදරාවන්ය.
(3) කිසාගෝතමියය. (4) සුජාතාවන්ය.

16. යසෝදරා දේවියගේ පියාගේ නම වන්නේ,
(1) සුප්පබුද්ධ රජතුමාය. (2) බිම්බිසාර රජතුමාය.
(3) සුද්ධෝදන රජතුමාය. (4) කාලාශෝක රජතුමාය.

17. සිව්පසට අයත් වේ,
(1) .සේනාසන (2) දැහැත් (3) පානීය ජලය (4) කැඳ

18. ත්‍රිවිධ රත්නයේ ගුණ,
(1) 28 කි. (2) 21 කි. (3) 24 කි. (4) 26 කි.

19. කුසල මූල තුනට අයත් වේ,
(1) ලෝභ (2) විරාගය (3) මෝහ (4) රාගය

20. සංඝරත්නය විසින් ආගමික, සාමාජික, ජාතික වශයෙන් සිදු කළ සේවාවන් අතර ජාතික සේවාවක් ලෙස සැළකිය හැක්කේ,
(1) අධ්‍යාපනය ලබාදීම. (2) බණ දේශනා කිරීම.
(3) ඉගෙන ගැනීම. (4) ගරා වැටුණු විහාර ප්‍රතිසංස්කරණය කිරීම.

21. වන්දනා නඩයක ප්‍රධානියා හැඳින්වුයේ මේ නාමයෙනි,
(1) නඩේ ගුරා (2) ඇදුරු තුමා (3) මඟපෙන්වන්නා (4) දායකයා

22. මහා ප්‍රජාපතී ගෝතමී තෙරණියගේ ධාතු තැන්පත් කොට ස්තූපයක් ඉදිකරන ලද්දේ,
(1) ලිච්ඡවි රජ දරුවන් විසිනි. (2) සුජාතා සිටුදේවිය විසිනි.
(3) අජාසත්ත රජතුමා විසිනි. (4) මල්ලව රජදරුවන් විසිනි.

23. කිඹුල්වත්පුර ගමන සිදු වූයේ බුද්ධත්වයෙන් කොපමණ කලකට පසුවද ?
(1) බුද්ධත්වයෙන් පළමු වර්ෂයේ (2) බුද්ධත්වයෙන් මාස 6 ට පසුවය.
(3) බුද්ධත්වයෙන් තෙවන වර්ෂයේ (4) බුද්ධත්වයෙන් මාස 7 ට පසුවය.



Scanned with CamScanner

24. ධම්ම පදයේ සඳහන් ගාථා හා වර්ග ගණන අනුපිළිවෙල ලියන්න.
(1) ගාථා 426 කි. - වර්ග 27 කි. (2) ගාථා 428 කි. - වර්ග 26 කි.
(3) ගාථා 423 කි. - වර්ග 26 කි. (4) ගාථා 324 කි. - වර්ග 28 කි.

25. වචනයෙන් සිදුවන වැරදි හතරින් එකකි,
(1) ප්‍රාණඝාතය (2) විරමණය (3) සම්පප්ඵලාපය (4) අදත්තාදානය

26. සඟ ගුණයකි,
(1) ආකාලිකෝ (2) ලෝකවිදූ (3) සුපටිපන්නෝ (4) අරහං

27. කුසල් සිතුවිලිවලට බාධා කරන සිතුවිලි අප හඳුන්වන්නේ,
(1) පංච නීවරණ නමිනි. (2) කාමච්ඡන්ද නමිනි.
(3) කාමාවචර නමිනි. (4) රූපාවචර නමිනි.

28. සමථ භාවනාව හඳුන්වන නමකි,
(1) විදර්ශනා භාවනාව (2) තිලක්ෂණ භාවනාව
(3) චිත්ත භාවනාව (4) ධම්මානුස්සති භාවනාව

29. මඟ පෙන්වීමෙන් තොරව භාවනාවට යොමු වූ අයෙකු වන්නේ,
(1) ධර්මාරාම හිමි (2) ඡන්න හිමි
(3) ආනන්ද හිමි (4) ස්වර්ණකාර හිමි

30. විපස්සනා භාවනාව වැඩීමේ ප්‍රයෝජනයකි,
(1) ඇලීම් ගැටීම්වලින් තොර වීම. (2) මතක ශක්තිය
(3) හොඳින් නින්ද යෑම. (4) ඉවසීම

31. වැලිවිට සරණංකර හිමි විසින් රචිත ග්‍රන්ථයකි,
(1) මුණිගුණාලංකාරය (2) බුදුගුණ අලංකාරය
(3) ලෝකෝපකාරය (4) හිතෝපදේශය

32. අසරණ සරණ සරණංකර හිමියන්ගේ උපත සිදු වූ වර්ෂය හා දිනය ලෙස සැලකෙන්නේ,
(1) 1968 ජුනි 10 වැනි දාය. (2) 1691 ජුනි 17 වැනි දාය.
(3) 1698 ජුනි 18 වැනි දාය. (4) 1968 ජුලි 19 වැනි දාය.

33. දුටුගැමුණු රජතුමා සෑදූ වෙහෙරකි,
(1) මිරිසවැටිය (2) අභයගිරිය (3) ථූපාරාමය (4) සේල චෛත්‍යය

34. දුටුගැමුණු කුමරු පියා සමග අමනාප වී සැඟව සිටියේ,
(1) කොත්මලේය. (2) කන්ද උඩරටය. (3) කතරගමය. (4) රුහුණු රටය.

35. දුටුගැමුණු රජතුමාගේ සහෝදරයාගේ නම,
(1) එළාරය. (2) සද්ධාතිස්සය. (3) කාවන්තිස්සය. (4) අභයතිස්සය.

36. ව්‍යාපාදය උපමා කර ඇත්තේ,
(1) බොර වතුරටය. (2) උතුරන වතුරටය.
(3) පාට කළ වතුරටය. (4) තඹ පාට වතුරටය.

37. උත්සාහය පෙරටු කරගෙන ගුණ නුවණින් ක්‍රියා කොට ජීවිතය ජයගත් සමකාලීන තරුණයෙකුට බුදුන් වහන්සේ දේශනා කළ ධම්මපද ගාථාව මෙය වේ.
(1) අචරිත්වා බ්‍රහ්ම චරියං යන ගාථාව (2) දූරංගමං ඒක චරං යන ගාථාව
(3) අප්පමාදෝ අමත පදං යන ගාථාව (4) උට්ඨානවතෝ සතිමතෝ යන ගාථාව



Scanned with CamScanner

38. "බෞද්ධ ළමයා" කෘතිය රචනා කළ කතුවරයා මේ නමින් හඳුන්වයි.
(1) පැලෑනේ සිරිවජිරඥාන හිමි.
(2) කොටපොළ අමරකිත්ති හිමි.
(3) තොටගමුවේ රාහුල හිමි.
(4) වැලිවිට සරණංකර හිමි.

39. අතිපූජ්‍ය බලංගොඩ ආනන්ද මෛත්‍රී හිමියන්ට පිරිනැමූ ගෞරව නාමයකි,
(1) අග්ග මහා පණ්ඩිත
(2) අභිධර්ම විශාරද
(3) සද්ධර්ම කීර්ති
(4) ධම්ම කථික

40. ශ්‍රී ලංකාවේ ඇති සුවිශේෂ බුද්ධ ප්‍රතිමා හතරින් එකකි,
(1) මහමෙව්නාවේ සමාධි ප්‍රතිමාව
(2) තිවංක පිළිමගෙය
(3) කිරිවෙහෙර පිළිම වහන්සේ
(4) දඹුලු විහාරයේ සමාධි පිළිමය

PAST PAPERS WIKI

Scanned with CamScanner

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**Royal College - Colombo 07**
**රාජකීය විද්‍යාලය - කොළඹ 07**

81 | S | II

**Grade 10 – First Term Test – July 2023**

කාලය : පැය 2
Time: 2 hours

**පළමු වාර පරීක්ෂණය - 2023 ජුලි - 10 ශ්‍රේණිය**

# බුද්ධ ධර්මය - II

Name: - ........................................ Class: -.................. Index no: - ....................

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20 කි. අනෙක් ප්‍රශ්නවලට ලකුණු 10 බැගින් ලකුණු 60 කි.**

01. (i) පංචමහා විලෝකනය නම් කරන්න.
(ii) සිදුහත් කුමරු හැදෑරූ ශිල්ප දෙකක් ලියන්න.
(iii) ජේතවනාරාමය හා පූර්වාරාමය කරවා පූජා කළේ කවුරුන් විසින්ද ?
(iv) "රාහුලෝ ජාතෝ බන්ධනං ජාතං" මෙහි තේරුම ලියන්න.
(v) බොර ජලයෙහි කිසිවක් පැහැදිලිව නොපෙනේ. එසේ උපමා කොට ඇති නීවරණ ධර්මය කුමක්ද ?
(vi) "විස්සේන පස්සති විපස්සනා" මෙහි තේරුම ලියන්න.
(vii) ලෝකය හා ජීවිතය පිළිබඳව අපට ඇති කරගත හැකි අවබෝධය දෙයාකාරය. එම ආකාර දෙක ලියන්න.
(viii) චරිත ස්වභාවය අනුව පුද්ගල චරිත හයකි. දෙකක් ලියන්න.
(ix) අසරණ සරණ සරණංකර හිමියන් රචනා කළ ග්‍රන්ථ දෙකක් ලියන්න.
(x) රහසත් පව් නොකොට - කෙලෙසයෙනුත් දුරු කොට
.................................... - ............................................
ඉතිරි කොටස සම්පූර්ණ කරන්න. (ල. 2 x 10 = 20)

02. (i) බෞද්ධ භාවනාවේ ප්‍රධාන ප්‍රභේද දෙක නම් කරන්න. (ල. 2)
(ii) භාවනාවට පෙර සම්පූර්ණ කළ යුතු පූර්ව අවස්ථා 3 නම් කරන්න. (ල. 3)
(iii) එම භාවනා හා අනෙකුත් භාවනා මගින් ශිෂ්‍ය ජීවිතයට උදාකරගත හැකි යහපත පැහැදිලි කරන්න. (ල. 5)

03. (i) සම්පූර්ණ කරන්න.
උට්ඨානවතෝ සතිමතෝ - සුචිකම්මස්ස නිසම්මකාරිනෝ (ල. 2)
.......................................................................................
(ii) පුද්ගලයෙකුගේ යසස වර්ධනය වන කරුණු 3ක් ලියන්න. (ල. 3)
(iii) ශිෂ්‍ය ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා ඔබ දැක්වූ ගුණ තුන පිළිබඳ විස්තරයක් සපයන්න. (ල. 5)

04. (i) සිදුහත් කුමරු ශිල්ප ඉගෙන ගත් ගුරුවරයා කවුද ? (ල. 2)
(ii) සිදුහත් කුමරු මුහුණ දුන් අභියෝග 3 ක් සඳහන් කරන්න. (ල. 3)
(iii) වර්තමානයේ දරුවන් මුහුණ දීමට සිදුවන අභියෝග රැසකි. අභියෝග මැද ජය ගනිමු. විස්තර කරන්න. (ල. 5)



Scanned with CamScanner

05. (i) පළමු සංගායනාවේ මූලිකත්වය හා දායකත්වය දැරූ අය නම් කරන්න. (ල. 2)

(ii) ඉන් ලද ප්‍රතිඵල 3ක් ලියන්න. (ල. 3)

(iii) ගැටළු විසඳා ගැනීමට හොඳම මග සාකච්ඡාවයි.

පන්ති කාමරය, නිවෙස්, සමිති සමාගම්, ක්‍රීඩා කණ්ඩායම් සම්බන්ධ කර ගනිමින් විස්තර කරන්න. (ල. 5)

06. (i) ගිහියාගේ නිත්‍ය සීලය කුමක්ද ? (ල. 2)

(ii) පංචසීලයේ මුල් සිල් පද තුන පිළිවෙලින් ලියන්න. (ල. 3)

(iii) "සීලය සැපත සදා දෙයි" විස්තර කරන්න. (ල. 5)

07. පහත මාතෘකා දෙකකට කෙටි සටහන් ලියන්න.

(i) දුටුගැමුණු රජතුමා

(ii) සරණංකර හිමි

(iii) චතුරාර්ය සත්‍ය

(iv) පන්සිල් (ල. 2 X 5 = 10)

Scanned with CamScanner

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න